# 17. ජොහාන් හමු වූ ජේසුතුමා

බොහෝ කාලයකට පෙර පලස්තීන දේශයේ සෙනහට දෙවි පියාගේ පණිවිඩයක් කියා දුන් මිනිසකු සිටියා. ඔහුගේ නම ජොහාන්.

ජොහාන් දෙවි පියාගේ පණිවිඩය මිනිස්සුන්ට කියා දුන්නේ ජෝර්දාන් ගං ඉවුරේ සිට ය. මෙම පණිවිඩය ඇසීමට මිනිස්සු වැල නොකැඩී ගඟ ළඟට ආවා.

එසේ පැමිණි ජනයාට ජොහාන්තුමා මෙසේ කිවුවා. දෙවි පියාගේ කරුණාව අපට ලැබෙනවා. ඒ කරුණාව ලබා ගැනීමට කළ වැරදිවලට කණගාටු වී, දෙවි පියා කමාව දෙන බව විශ්වාස කර මේ ගඟේ වතුරෙන් පවිත්‍ර වන්න'

මේ පණිවිඩය පිළිගත් අය තමන්ගේ වැරදි ගැන කණගාටු වී ජොහාන්තුමා ලවා ඒ වතුරෙන් ස්නාපනය ලබා ගත්තා.

ජේසුතුමාත් පැමිණ ජොහාන්ගෙන් ස්නාපනය ඉල්ලුවා. එතුමා ජොහාන්ට වඩා හුඟාක් උතුම් කෙනෙක් බව ජොහාන් සෙනහට පැවසුවා.



ජේසුතුමා ස්නාපනය කරන්නට ජොහාන් මුල දී අකමැති වුණා. එහෙත් පසුව ස්නාපනය කළා. මේ වේලාවෙ මහා පුදුම දෙයක් සිද්ධ වුණා. අහස විවෘත වී "**මේ මාගේ ආදරවන්ත පුත්‍රයාණෝ** යැයි හඬක් ඇසුණා. මිනිස්සු පුදුමයට පත් වුණා. හැම දෙනා ම දෙවි පියාට ප්‍රශංසා කළා.

## පැවරුම්

පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. ජොහාන් ඉගැන්වූයේ කාගේ පණිවිඩය ද?
2. දෙවි පියා වැරදි කළ අයට කමාව දෙන්නේ ඒ අය කුමක් කළ විට ද?
3. ජේසුතුමා ස්නාපනය ලබන විට දෙවි පියා පැවසුවේ කුමක් ද?